මාධ්‍ය නිවේදන අංක 15

මැතිවරණ කොමිෂන් සභාව

# මාධ්‍ය නිවේදනය

- මැතිවරණ නීති සංශෝධන පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාව

මැතිවරණ කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි මැතිවරණ නීති සංශෝධනය පිණිස පත් කරනු ලැබූ විශේෂ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව ස්වකීය යෝජනා ඇතුළත් නිර්දේශ 2022.06.22 දින පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. ප්‍රජාතන්ත්‍රවාදය පුළුල් කිරීම සඳහාත් නිදහස් හා සාධාරණ මැතිවරණ ක්‍රියාවලියක් සඳහාත් ප්‍රබල අත්තිවාරමක් සපයන මෙම යෝජනා සඳහා දායකත්වය දැක්වූ තේරීම් කාරක සභා සාමාජිකයන් ඇතුළු සියළුම දේශපාලන පක්ෂවලට, මහජන නියෝජිතයන්ට, සිවිල් සංවිධාන හා පොදු ජනතාව වෙත මැතිවරණ කොමිෂන් සභාව ප්‍රණාමය පුදකර සිටින අතර, මෙම යෝජනා නීතිගත කරගැනීම සඳහා සක්‍රීයව දායකත්වය දක්වන ලෙස ද එම සියළු පාර්ශ්ව වෙතින් ඉල්ලා සිටී.

- දේශපාලන පක්ෂ පිළිගැනීම

2022 වර්ෂය සඳහා දේශපාලන පක්ෂ පිළිගැනීමෙ සම්මුඛ පරීක්ෂණ 2022 ජූලි මස 04 දින සිට ආරම්භ කිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කර ඇත.

- ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

2021 ජූනි මස 01 දින සිට 2022 ජනවාරි මස 31 දින දක්වා කාලසීමාව තුළ යම් දිනකදී අවුරුදු 18 සම්පූර්ණ කරන (එනම් 2003.06.01 දින සිට 2004.01.31 දින දක්වා උපන්) තැනැත්තන්ට ඡන්ද බලය හිමිවන පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සඳහා හිමිකම් ඉල්ලීම් භාරගැනීම 2022 ජූනි මස 24 දින අවසන් වේ. මෙතෙක් පරිපූරක ලැයිස්තු සඳහා නම ඇතුළත් නොවූ තැනැත්තන්ගේ හිමිකම් ඉල්ලීම් භාරගැනීම සඳහා 2022 ජූනි මස 24 දින සියළුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල විවෘතව තබන බව දැනුම් දෙනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.

2022.06.22